# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## විශ්වවිද්‍යාල ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2020/2021

### ශාස්ත්‍රවේදී (ගෞරව) පරිවර්තන අධ්‍යයන (සිංහල/ඉංග්‍රීසි) උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරාගැනීම සඳහා වන අභියෝග්‍යතා පරීක්ෂණයට අයදුම්පත් කැඳවීම

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා ප්‍රවේශයට අදාළ ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබ ඇති අත්පොතෙහි අංක 1.2 හා 2.2.8.28 දරන වගන්ති යටතේ සඳහන් කර ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන ඉහත උපාධි පාඨමාලාවට සිසුන් තෝරාගැනීම සඳහා පැවැත්වෙන අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කළ අයදුම්පත්වලට අමතර ව මෙම අභියෝග්‍යතා පරීක්ෂණයට ද අයදුම් කර එයට පෙනී සිට එයින් සමත් විය යුතු ය.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ සාමාජීය විද්‍යා හා භාෂා පීඨයේ භාෂා අධ්‍යයනාංශය පවත්වන චතුර් වාර්ෂික වෘත්තීය උපාධි පාඨමාලාවක් වන මෙය ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා සපුරාලීමේ ක්‍රියාමාර්ගයෙහි කොටසක් ද වේ.

මෙම උපාධි පාඨමාලාවේ මූලික අරමුණ වන්නේ භාෂා පරිවර්තනය පිළිබඳ සෛද්ධාන්තික දැනුමෙන් සහ ප්‍රායෝගික කුසලතාවන්ගෙන් යුතු විද්‍යාර්ථීන් නිර්මාණය කිරීම යි. ත්‍රිභාෂා ප්‍රතිපත්තිය මෙහි ලා ක්‍රියාත්මක වන අතර උපාධි අපේක්ෂකයන්ගේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව වර්ධනයටත්, ඔවුන්ට දෙමළ භාෂා ප්‍රවීණතාව ලබාදීමටත් එයින් අපේක්ෂිත ය.

2020 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිට කවර හෝ විෂය ධාරාවකින් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලබා තිබෙන අපේක්ෂකයෝ අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබති. යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වීමේ අරමුණ වන්නේ පාඨමාලාව හැදෑරීම සඳහා යෝග්‍ය සිංහල සහ ඉංග්‍රීසි භාෂා කුසලතාවෙන් යුතු ශිෂ්‍ය කණ්ඩායමක් තෝරාගැනීම යි.

මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමේ දී සබරගමුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය (*www.sab.ac.lk*) භාවිතා කළ යුතු අතර අදාළ අධ්‍යාපන සහතිකවල සහ ලංකා බැංකුවේ 0002246976 අංක දරන, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ගිණුම් අංකයට බැර වන සේ ගෙවන ලද රු 750/- ක ලදුපතෙහි පිටපතෙහි ඊ පිටපතක් (Scanned Copy/image ) ඒ සමඟ එවිය යුතුය.

**එයට අමතර ව අ.පො.ස (උසස් පෙළ) සහතිකයේ සහ පොදු ප්‍රශ්න පත්‍රයෙන් සමත් බවට සඳහන් සහතිකයේ ඊ පිටපත් විදුහල්පති හෝ සාමදාන විනිශ්චකාරවරයකු හෝ ලවා සහතික කරවාගෙන එහි පිටපතක් (Scanned Copy/image) ඒ සමඟ එවිය යුතු ය.** අදාළ සහතික පිටපත්වල සහතික කරන්නාගේ නිල මුද්‍රාව තබා තිබිය යුතු ය. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් **2021 06 18 වන දින**

**හෝ ඊට පෙර (අයදුම්පත් භාර ගන්නා දිනය 2021. 06 .18 දක්වා දීර්ඝ කර ඇත)** තම අයදුම්පත පහත වෙබ් ලිපිනයට පිවිස සම්පූර්ණ කළ යුතු ය.

අදාළ අභියෝගයතා පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය දිනය,වේලාව සහ විභාග ශාලාව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත පමණක් ලිපි මඟින් පෞද්ගලික ව දැනුම් දෙනු ඇත.

**නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොර ව ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

ලේඛකාධිකාරී

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බෙලිහුල්ඔය

2021.05.16

**පහත වෙබ් ලිපිනයට පිවිස අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය.**